මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2018 අංක 09 2018 ඔක්තෝබර් 01

## මෝටර් වාහන ආනයනය කිරීම අවම කිරීමේ ක්‍රියාමාර්ග

**2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

ආනයන සහ එහි ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය මත ඇති වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත දැක්වෙන ක්‍රියාමාර්ග සකස් කර ගන්නා ලෙස නියම කරයි.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 02 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානයන් හි 2.1 විධානය පහත පරිදි ප්‍රතිස්ථාපනය කෙරේ.

   මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ලබාදෙන ණය පහසුකම් නැවත දැනුම් දෙන තුරු එම වාහන වල වෙළඳපොල වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශතයන් නොඉක්මවිය යුතුය.

   i ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා,

**වගු අංක 01 - වටිනාකම මත ණය අනුපාත**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | විද්‍යුත් වාහන | වෙනත් |
|---|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ | B [(සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)] | 90% | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 90% | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) | 90% | 70% |

| | | |
|---|---|---|
| දෙමුහුම් මෝටර් කාර්, වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV) | B [(සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)] | 50% |

ii පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**